# අධ්‍යයනයේ සාරාංශය.

විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ ඒ විෂයයන් සඳහා සතියකට නිශ්චිත කාලපරිච්ඡේද සංඛ්‍යාවක් බැගින් වෙන්කර ඇත. නමුත් විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා එසේ කාලය වෙන්කර නැත. එබැවින් පාසලෙහි විෂය සමගාමී කටයුතු සංවිධානයේ දී විවිධ ගැටලු පැන නගී. පාසල මෙයට මුහුණ දෙන ආකාරය පිළිබඳව මේ අධ්‍යයනයෙන් විමර්ශනය කෙරේ.

පසුගිය කාලයේ දී විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව සාහිත්‍යයෙන් විමසා ඇත. කන්නන්ගර වාර්තාව විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම සවිස්තරව සාකච්ඡා කර ඇත. එම වාර්තාවේ ක්‍රීඩා හා බාලදක්ෂ කටයුතු කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා ඇත. ක්‍රීඩාව කාලය නාස්තිකිරීමක් ලෙස ඇතැම් දෙමව්පියන් දරන මතය දැඩි ලෙස විවේචනය කෙරෙන එම වාර්තාව පෞද්ගලික ජයග්‍රහණයන් පමණක් නොව කණ්ඩායම් සාර්ථකත්වය සඳහා ද සිසුන් පෙළඹවිය යුතු බව දක්වයි. තවද හැකිතාක් සිසුන් සංඛ්‍යාවකට " ක්‍රීඩා දිනයක් " පැවැත්වීමේ අවශ්‍යතාව ද අවධාරණය කරයි. එවැන්නකින් සිසුනට තම පාසල පිළිබඳ ලැදියාවක් ඇතිවන බව පෙන්වා දෙන වාර්තාව, විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයෙන් සිසුන් මුදවා ගතයුතු බව ද පෙන්වා දෙයි. 1961 ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවේ ගුරු සිසු සබඳතා වඩාත් යහපත් කිරීමට විෂය සමගාමී ක්‍රියාකාරකම් හේතුවන බව පෙන්වා දී ඇත.

පාසලේ දැනට ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් මොනවා ද ඒ කෙරෙහි ශිෂ්‍ය සහභාගිත්වය කවර මට්ටමකින් සිදුවේ ද ශිෂ්‍ය සාධනය කෙරෙහි එය කවර ආකාරයෙන් බලපායි ද යන්න හා පාසලේ මේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී පාසල මුහුණ දෙන බාධක හා ගැටලු හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ.

කොලොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ ජාතික පාසල් දෙකක් 1AB පාසලක් හා 1C පාසලක් නියෝජනය වන පරිදි පාසල් හතරක් නියැදිය ලෙස තෝරාගෙන ඇත. එම පාසල් හතරේ විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ගුරුවරුන්, සිසුන් හා දෙමව්පියන් නියැදියක් ලෙස යොදාගෙන ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, තොරතුරු ගවේෂණ පත්‍රිකා, පතපොත හා පාසල් වාර්තා මගින් දත්ත රැස්කර ගන්නා ලදී. මේ දත්ත විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී.

පාසලෙහි බහුල ලෙස ක්‍රියාත්මකවන විෂය සමගාමී ක්‍රියාකරකම් රාශියක් ඇතත් ඒවායින් ක්‍රීඩා අංශයටත් භාෂා හා සාහිත්‍ය සමාගම් අංශයටත් විශේෂ අවධානය යොමුවී ඇති බව විශ්ලේෂණයෙන් හෙළි විය. එම අංශවල ක්‍රියාකාරකම් සඳහා සිසුන්ගේ සහභාගිත්වය අනිකුත් සමගාමී ක්‍රියාකාරකම්වලට වඩා ඉහළ මට්ටමක පවතින බව දක්නට ලැබුණි. සෞන්දර්ය අංශයට අදාළ ක්‍රියාකාරකම් ද ප්‍රශස්ත මට්ටමකට ක්‍රියාත්මක වන බව පෙනුණි. එහෙත් කෘෂිකර්ම විද්‍යාව ආශ්‍රිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වීම දුර්වල මට්ටමක පවතී.

පාසල්වල විදුහල්පතිවරු හැකි මට්ටමින් විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට සිසුන් සහභාගි කරවීමට උත්සහ ගනිති. එහෙත් සිසුන්ගේ අපේක්ෂාවන් වෙනස් බැවින් ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයේ අඩුවක් දක්නට ලැබේ. ගුරුවරුන් සහායකයින් ලෙස මේ ක්‍රියාවලියේ පෙනී සිටියත්, ඔවුන්ගේ ප්‍රායෝගික කුසලතා ප්‍රමාණවත් ලෙස වර්ධනය වී නොමැත. ශිෂ්‍ය සහභාගිත්වය වර්ධනය කිරීමට එය බාධාවක් වී ඇත.

පාසලේ දී ක්‍රියාත්මකවන විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම පිළිබඳව සිසුන්ට ගුරුවරුන්ට හා දෙමාපියන්ට පැහැදිලි අවබෝධයක් ඇති කිරීමට කටයුතු කිරීම, විෂය සමගාමී ක්‍රියාකාරකම් ගුරුවරුන් වෙත භාර කිරීමේ ක්‍රියාවලිය විචාරවත් කිරීම, විෂය ක්‍රියාකාරකම් හා විෂය සමගාමී ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී අන්‍යොන්‍යව සිදුවන අවහිරතා අවම වන ලෙස සංවිධාන ව්‍යුහය දියුණු කිරීම හා විෂය සමගාමී ක්‍රියාකාරකම්වල දී ද පාසල් ප්‍රජාව ආශ්‍රිත සම්පත් පුද්ගලයන්ගේ සහාය ලබාගැනීම ආදී යෝජනා ඉදිරිපත් කර ඇත.